**<u>සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය</u>**

**<u>සබරගමුව පළාත් සභාව</u>**

**<u>පුරප්පාඩු තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම</u>**

## 1. කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය MA 2-3

| තනතුරු නාමය | තනතුරු ප්‍රමාණය | වැටුප |
|---|---|---|
| තාක්ෂණ නිලධාරී(සිවිල්) | 06 | 01/2025 චක්‍ර ලේඛය පරිදි මූලික වැටුප රු. 44,867.00 කි.<br>මීට අමතරව අධිකාරිය විසින් අනුමත කරනු ලබන අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. |
| තාක්ෂණ නිලධාරී(යාන්ත්‍රික) | 02 | |

### 1.1 සුදුසුකම්

**බාහිර අයදුම්කරුවන්**

**<u>තාක්ෂණ නිලධාරී (සිවිල්) /තාක්ෂණ නිලධාරී (යාන්ත්‍රික)</u>**

(i) තනතුරෙහි කාර්යයභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

### 1.2 වයස

අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 1.3 බඳවාගැනීමේ ක්‍රමවේදය

ලිඛිත තරඟ විභාගයක හා/හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

### 1.4 වෙනත් සුදුසුකම්

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම සබරගමුව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුන (03) ට නොඅඩු කාලයක් සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

## 2. ප්‍රාථමික ශිල්පීය සේවා ගණය PL -3

| තනතුරු නාමය | තනතුරු ප්‍රමාණය | වැටුප |
|---|---|---|
| මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 2 | 01/2025 චක්‍ර ලේඛය පරිදි මූලික වැටුප රු. 38,387.00කි. මීට අමතරව අධිකාරිය විසින් අනුමත කරනු ලබන අනෙකුත් දීමනා ගෙවනු ලැබේ |

### 2.1 සුදුසුකම්

**බාහිර අයදුම්කරුවන් :-**

එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්ව ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) සේවා ගණයක සේවකයින්

හෝ

එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

### 2.2 වයස

අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 2.3 බඳවාගැනීමේ ක්‍රමවේදය

තනතුරට අදාළ වන පරිදි වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගැනේ.

### 2.4 වෙනත් සුදුසුකම්

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම සබරගමුව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුන (03) ට නොඅඩු කාලයක් සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**3. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය - PL 1**

| තනතුරු නාමය | තනතුරු ප්‍රමාණය | වැටුප |
|---|---|---|
| සහායක (වාහන සේවා අංශය සහ වාහන අලුත්වැඩියා අංශය | 02 | 01/2025 චක්‍ර ලේඛය පරිදි මූලික වැටුප රු. 36,475.00 කි. මීට අමතරව අධිකාරිය විසින් අනුමත කරනු ලබන අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. |

**3.1 සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් :-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම.

**3.2 වයස් සීමාව**

අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**3.3 බඳවාගැනීමේ ක්‍රමවේදය**

වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිපල මත බඳවාගැනීම සිදු කෙරේ.

**3.4 වෙනත් සුදුසුකම්**

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම සබරගමුව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුන (03) ට නොඅඩු කාලයක් සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

විධායක අධ්‍යක්ෂ,
සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය,
පැරඩයිස්,
කුරුවිට.